## ජීවනෝපාය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ සබඳතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2012

1. **මතය.**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැළපීම්වලින් ඇති වන බලපෑම් හැරුණු විට මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**.

2.1 **මූල්‍ය කාර්යය සාධනය.**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.205,098,202 ක් වූ අතර, 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.359,333,782 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, පෙර වර්ෂය සඳහා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
| --- | --- | --- | --- |
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 85,859,650 | 104,188,900 | 190,048,550 |

| | | | |
|---|---|---|---|
| උපකරණ, ලෝහ භාණ්ඩ හා ද්‍රව්‍ය | 69,236,113 | 24,252,036 | 93,500,497 |
| වර්ධක කළමනාකරණ පිරිවැය | 8,925,776 | 7,886,807 | 22,179,754 |
| පුහුණු, වැඩමුළු හා මහජන සහභාගීත්වය | 30,030,939 | 9,594,380 | 40,433,109 |
| උපදේශණ සේවා | 7,020,000 | - | 7,020,000 |
| වෙනත් යෙදවුම් | 4,025,724 | 2,126,148 | 6,151,872 |
| එකතුව | 205,098,202 | 148,048,271 | 359,333,782 |

2.2 <u>අග්‍රිම අරමුදල් ගිණුම.</u>

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා එම දිනට ගිණුමේ පැවති ශේෂය සාරාංශ කර පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 45,236.94 | 5,152,546 |
| එකතු කළා - ඌන පූරණයන් | 1,421,103.05 | 179,423,956 |
| විදේශ විනිමය වාසිය | - | 1,030,795 |
| | 1,466,339.99 | 185,607,297 |
| අඩු කළා - ආපසු ගැනීම් | 1,465,882.48 | 185,549,120 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 457.51 | 58,177 |

3. <u>විගණන නිරීක්ෂණ</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>ව්‍යාපෘතියේ අරමුණු ලගාකර ගැනීම</u>

ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇඑජ ඩොලර් 3,429,056 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට එහි ප්‍රගතිය පහත දැක්වේ.

( i ) <u>මාර්ග ඉදිකිරීම්</u>

උතුරු මැද සහ නැගෙනහිර පළාත් වල තොරාගත් දිස්ත්‍රික්ක 04 ක ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 250 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තීරණය කර තිබුණද ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘතිය අවසානයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 290 ක් ප්‍රතිසංස්කරණය කර තිබූ බව අනාවරණය විය.

( ii ). <u>ස්වයං රැකියා සඳහා පුහුණු කිරීම</u>

සාමාජිකයින් 900 ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට රු. 44,091,600 (ඇඑජ ඩොලර් 367,430) ක මුදලක් වෙන්කර තිබුණි. ලබා දුන් තොරතුරුඅනුව රු. 152,400 (ඇඑජඩොලර් 1270) ක අමතර අරමුදලක් ද සමගින් රු. 44,244,000 (ඇඑජ ඩොලර් 368,700) ක වියදමින් සාමාජිකයින් 2134 ක් පුහුණු කර තිබුණි.

(iii). <u>ප්‍රතිලාභීන්ගේ දායකත්වය</u>

ප්‍රතිලාභීන් 2340 ක් සිවිල් වැඩ සඳහා යෙදවීමට බලාපොරොත්තු වූ නමුත් ප්‍රතිලාභීන් 2918 ක් යොදවා තිබුණු අතර ඒ සඳහා දීමනා ලෙස එක් අයකුට වැඩ කරන දිනයකට රු. 500 බැගින් රු.189,203,950 ක් ගෙවා තිබුණි. ආධාර සහයක වාර්තාවෙහි ව්‍යාපෘතියේ සේවක දායකත්වය ලෙස රු. 39,486,720 ක් ලෙස හඳුනා ගෙන ඇති බව අනාවරණය විය. කෙසේ වුවද ප්‍රතිලාභීන් විසින් දායකකරණ ලද සත්‍ය සේවක පිරිවැය හඳුනගෙන ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ). මුදල් රෙගුලාසි 133 අනුව ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ක්‍රියාකාරිත්වය සඳහා අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කල යුතු වුවද , ව්‍යාපෘතියේ කටයුතු වලට අදාලව එවැනි විගණනයක් කල බව තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් නොවීය.

(ඇ). මැදිරිගිරිය සහ කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල ග්‍රාමීය මාර්ග ඉදිකිරිම සහ නඩත්තු කිරිම සම්බන්ධව සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දී පහත කරුණු අනාවරණය විය.

(I). <u>මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව</u>

i. මාර්ග 07 ක් පරීක්ෂා කරන ලද අතර සියලුම මාර්ග නිවැරදිව නඩත්තු කර නොතිබු අතර කාණු පස් සහ මඩ වලින් පිරී තිබු අතර නිවාස ඉදිරිපිට හැර මාර්ගයේ දෙපසම කැලෑ වැවී තිබුණි.

ii. ව්‍යාපෘතිය විසින් මේ වන විටත් ප්‍රාදේශීය සභාව වෙත භාර දෙන ලද උපකරණ ලබා ගැනීමේ හැකියාව පිළිබඳව ප්‍රජා පාදක සංවිධානවල නොදැනුවත් කම නිසා මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අතපසු කර තිබුණි. තවද මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මහජනතාව උනන්දු කිරීමද ප්‍රාදේශීය සභාව සිදුකර නොතිබුණි.

(II). <u>කන්තලේ ප්‍රාදේශීය සභාව</u>

(i) මාර්ග දෙකක් පරීක්ෂා කරන ලද අතර නිවාස ඉදිරිපිට මාර්ගය පමණක් සුද්ද කර තිබුණි. නිවාස කිහිපයක් ඉදිරිපිට කාණු පස් වලින් පිරී තිබුණි.

(ii) කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ මාර්ග 08 ක් ඉදිකර තිබුණි. පහත උපකරණ මාර්ග 03ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලබා දී තිබු අතර ඒවා ප්‍රදේශිය සභාවට භාර නොදී ගම්වාසින් භාරයේ පැවතුණි.

| උපකරණ | අයිතම සංඛ්‍යාව |
|---|---|
| උදලු 9 x 9 | 24 |
| උදලු 8 x 10 | 19 |
| සවල් | 07 |
| කොන්ක්‍රීට් තාච්චි | 16 |
| විල්බැරැක්ක | 06 |
| අලවංගු | 07 |
| ගල් කටු | 07 |